**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන.
**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 21 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය.
-------

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල නොවන රු. 144,288 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල, සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද, නිළධාරීන් දෙදෙනෙකුට අදාල හිඟ වැටුප් රු. 55,680 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සටහන් කිරීම හේතුවෙන්, වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 අනුකූල නොවීම්
--------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 132 වගන්තිය | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව, පෞද්ගලික වාහන සඳහා අවස්ථා 02දී රු. 32,450ක් ගෙවා තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) | රීති අංක රාහා 59 | සමාලෝචිත වර්ෂයේ වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ii) | රීති 180 | ප්‍රාදේශිය සභාවේ මුදල් හා ගබඩා භාරව කටයුතු කරන නිළධාරින් විසින් ඇප තබා නොතිබුණි. |

**02.** **මූල්‍ය සමාලෝචනය.**

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයට අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම් ඉක්ම වූ ආදායම රු. 4,990,688 ක් වූ අතර ඊට අනුරූපිව, ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 1,677,272 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 1,135 | 1,135 | 2,162 |
| (ii) බදු කුලී | 3,087 | 3,087 | 26 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,128 | 1,128 | 44 |
| (iv) වෙනත් ආදායම් | 2,110 | 3,667 | 1,470 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහේස්ත්‍රාත් අධිකරණයක් වෙතින් රු. 80,583 ක උසාවි දඩ මුදල් ප්‍රමාණයක් ලැබිය යුතුව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අවිධිමත් ගනුදෙනු

(අ) පුහුණු වැඩ සටහන් වලට සහභාගි වීමේදි, ඒ සඳහා නවාතැන් පහසුකම් හා ආහාරපාන සපයා තිබියදීත්, සංයුක්ත දීමනා සහ යැපීම් දීමනා වශයෙන් රු. 13562 ක්, සමාලෝචිත වර්ෂයේ මුල් මාස 03 තුලදී නිලධාරින්ට ගෙවා තිබුණි.

(ආ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව සභාපතිවරයා හා උප සභාපතිවරයා වෙත පිළිවෙලින් මාසිකව රු. 5,000 ක් හා රු. 3,500 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 102,000 ක් ජංගම දුරකථන සඳහා වූ පෙර ගෙවුම් ටිකට්පත් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

(ඇ) පලාත් භාණ්ඩාගාර ප්‍රධාන ලේකම්ගේ 2014 ජනවාරි 22 දිනැති අංක EP/09/BD/2014/TELE 56 දරන ලිපිය අනුව ප්‍රාදේශිය සභාවේ ලේකම්ගේ ජංගම දුරකතන ගාස්තුව උපරිම මාසික සීමාව රු. 4000 නොඉක්මවිය යුතුය යන්න දක්වා ඇතත්, ලේකම් වෙත සමාලෝචිත වර්ෂයේ මුල් මාස 03 ක කාලය තුල, එම සීමාව ඉක්මවා රු. 5077ක් ගෙවා තිබුණි.

3.2 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2008 වර්ෂයේදී ලබා දී ඇති මහේන්ද්‍රා කැබ් රථය අලුත් වැඩියා කර භාවිතා කළ හැකි වුවත් , අලුත් වැඩියා කිරීමකින් තොරව වර්ෂ 4ට අධික කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතින.

(ආ) 2003 වර්ෂයේදි ලබා දී ඇති කැබ් රථයක් අලුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින අතර වර්ෂ 4ට අධික කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතින.

(ඇ) 2004 අගෝස්තු 12 දින රු. 216,550කට මිලදී ගෙන තිබුණු ත්‍රීරෝද රථය අලුත් වැඩියා කර ධාවනයට යොදා ගත හැකි තත්ත්වයේ පවතින නමුත්, වර්ෂ 2 කට අධික තිස්සේ කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) විධිමත් ලෙස මහවැලි අධිකාරියෙන් හිමිකාරීත්වය පවරා නොමැති රෝද හතරේ ට්‍රැක්ටර් රථයක් තවදුරටත් භාවිතයට ගත නොහැකි තත්වයේ පවතින අතර, එය ප්‍රාදේශීය සභා භූමියේ ගාල්කර තිබුණි.

(ඉ) අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි ට්‍රේලර් 02 ක් වර්ෂයකට අධික කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතින.

3.3 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

.............................

පහත සහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) වාහන පාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය